

# සඟසසුන බිහිකළ ඇසළ මස

වසර දෙදහස් හයසීයක් සපිරෙණ සහ සසුන බැතියෙන් සමරමු.

දෙදහස් එකොළහ වසර සම්බුද්ධත්ව ජයන්තිය සැමරීම ඇතුළු ශාසනික ඉතිහාසයට වැදගත්කමක් ගෙන දෙන වසරක් වශයෙන් හැඳින්විය හැක. බුද්ධ ශාසනයේ පැවැත්ම වෙනුවෙන් ඇපකැපවී එදා මෙදා තෙර අනූපමේය මෙහෙයක් ඉටුකරන මහා සංඝ ශාසනයද බිහිවී වසර 2600 ක් වෙයි. එය ඇසළ පුර පොහෝ දිනයට යෙදී ඇති අතර තවත් සුවිශේෂ සිදුවීම් කීපයක්ද ඒ පොහොය දිනයෙහි වෙයි.

බුදුරජුන්ගේ ප්‍රථම ධර්මදේශනය සිදුවී වසර 2600 කි. එසේම සිදුහත් කුමරුන් මහමායා කුස පිළිසඳ ගැන්ම, මහා අභිනිෂ්ක්‍රමණය හෙවත් සිදුහත් කුමරු ගිහිගෙය හැරයාම ආදී සිදුවීම් වූයේ ඇසළ පොහෝ දවසේ දී ය. එසේම බුදුරජානන් වහන්සේ පස්වග මහණුන් සමග ඉසිපතනයේ ප්‍රථම වස්වැසීම, රාහුල කුමරුන්ගේ ඉපදීම, බුදුහාමුදුරුවන් ශාක්‍යයන්ගේ මානය බිඳීම සඳහා යමා මහ පෙළහර පෑම, බුද්ධත්වයෙන් හත්වන වසරේදී බුදුන් වහන්සේ දෙව් ලොවට වැඩ මාතෘ දිව්‍යරාජයා ඇතුළු දෙවිවරුන්ට අභිධර්මය දේශනා කිරීම, බුදු රජුන්ගේ පිරිනිවීමෙන් පසු අජාසත් රජුගේ දායකත්වයෙන්, මහරහතන් වහන් සේලා 500 නමකගේ සහභාගිත්වයෙන් රජගහ නුවරදී ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීම, හේමමාලා කුමරිය හා දන්ත කුමරු ලංකාවට ගෙන ආ දන්තධාතූන් වහන්සේට ගෞරව කිරීම සඳහා කිත්සිරිමෙවන් රජ දවස ප්‍රථම දළදා පෙරහැර පැවැත්වීම ආදී බොහෝ වැදගත් කාරණා ඇසළ පොහොය මූලිකව සිදුව ඇත. බුදුදහම ලෝකයාට හඳුන්වාදෙමින් ශ්‍රද්ධාව ඇතිකරමින් සමාජය යහමගට යොමුකරවීමේ අභිලාෂයෙන් ගෘහස්ත ජීවිතයක් ගතකරන ගිහි කෙනෙකුගෙන් බුද්ධ ශාසනයට වන සේවයට වඩා, ඒ වෙනුවෙන් ම තම දිවිකැපකර ක්‍රියා කරන සංඝරත්නය වෙතින් ඉටුවන මෙහෙවර අති මහත් ය. එමෙන්ම ශාසනයේ උන්නතිය වෙනුවෙන් හිමි ගත් මගට පිළිපන් උන් වහන් සේලා කෝටි ගණනින් සසරින් එතෙර වූ බව පොත පතේ සඳහන් වෙයි.

වර්තමානයේ ද ශ්‍රමණ දම් පුරමින් ලෝ සතුනට දයානුකම්පාවෙන් යහමග පෙන්වා දී අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා ලබා දෙන අප මහා සංඝරත්නයට බුදු පසේබුදු මහ රහතන් වහන්සේලා පැමිණ වදාළ උතුම් නිවන් මග ලැබේවායි බැති සිතින් ප්‍රාර්ථනා කරමු.

බෙදන සතහට
සසර ගමනට
ගිලී සදහම් සාගරේ
නගන දම්හඬ දෙන්න
යහමග දිවිය කැපකර
ඇති වැරේ
දසුන හදවත් නිවී සනසන
දරාගෙන කහ චීවරේ
සසුන රකිනා සහරුවන
හට අමා නිවනේ
දොර ඇරේ

◆ **විමලා යාපා**
**( ඇඹිලිපිටිය )**
**Cyprus**


## Duke's Court Travel

## Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £300 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £248 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £245 + Taxes |
| Emirates | Emirates | fr £480 + Taxes |
| ETIHAD | Etihad Airways | fr £211 + Taxes |
| OMAN AIR | Oman Air | fr £199 + Taxes |
| JET AIRWAYS | Jet Airways | fr £210 + Taxes |

**Note:** All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

3045 ATOL PROTECTED — AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS — IATA

204 King Street, London W6 0RA


# කෝටි 4ක මත්කුඩු සමග ලාලිත්‍ර අත්අඩංගුවට (දිවයින 22/06/11)

කොළඹ නගරයේ ප්‍රධාන පෙළේ මත්කුඩු ජාවාරම්කරුවෙකු බව කියන ලාලිත්‍ර නමැත්තා කොළඹ දී අත්අඩංගුවට ගත් පොලිස් මත්ද්‍රව්‍ය නාශක අංශය රුපියල් කෝටි 4 කට අධික වටිනාකමින් යුත් හෙරොයින් තොගයක් ද අල්ලාගෙන තිබේ. මෙම මත්කුඩු ජාවාරම්කරුගේ ව්‍යාපාරවලට සම්බන්ධ කාන්තාවක්ද ඔහුට අයත් අධි සුඛෝපභෝගී මෝටර් රථයක්ද පොලීසිය අත් අඩංගුවට ගෙන ඇත.

මත්කුඩු ජාවාරම්කරු අත්අඩංගුවට ගැනීමෙන් පසු ඔහු මුදාගැනීම සඳහා රජයේ එක්තරා තරුණ මන්ත්‍රීවරයෙකු දැඩි උත්සාහයක නිරතවන බව ද පොලිස් ආරංචි මාර්ග සඳහන් කරයි. මෙම මන්ත්‍රීවරයා මත්ද්‍රව්‍ය අංශයේ නිලධාරීන්ට දිගින් දිගටම දුරකථනයෙන් කතාකරමින් අත් අඩංගුවට ගෙන සිටින තැනැත්තා ඉතා අහිංසකයෙකු බැවින් ඔහු මුදාහරින ලෙස බලපෑම් එල්ල කර ඇති බව ද පොලීසිය වැඩිදුරටත් සඳහන් කරයි.

අත්අඩංගුවට ගන්නා මොහොතේ ලාලිත්‍ර නමැත්තා සතුව හෙරොයින් ග්‍රෑම් 120 ක් ද මුදලින් රුපියල් හතලිස් ලක්ෂ අනූහයදාස් පන්සීයක්ද තිබුණු බව කියති. ඔහුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කරද්දී මත්ද්‍රව්‍ය ගබඩාකර තිබෙන වැල්ලම්පිටියේ ආරක්ෂිත නිවස පොලීසිය සොයාගත්තේ ය. හෙරොයින් කිලෝ 7 ක් හමුවුණේ එහි දී ය. කාන්තාව ද සිටියේ එහි ය.

දිවයින පත්‍රයේ පළවූ මේ ප්‍රවෘත්තිය නිසා රහස් පොලීසියේ පරීක්ෂකවරයෙක් දිවයින කාර්යාලයට ගිය සතියේ පැමිණ ඒ පුවත ලියූ මාධ්‍යවේදියාගෙන් දැඩිලෙස ප්‍රශ්නකර ඇත. කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී දුමින්ද සිල්වා කළ පැමිණිල්ලක් නිසා තමා පැමිණි බව කී පොලිස් පරීක්ෂකවරයා ඒ පුවතේ සඳහන් රජයේ මන්ත්‍රී දුමින්ද සිල්වා මන්ත්‍රී වරයායයි කෙනෙකුට හිතන්නට ඉඩ ඇති අයුරින් පුවත ලියා ඇතැයි දුමින්ද සිල්වා පැමිණිලිකර තිබෙන බව කියා පොලීසියෙන් දිවයිනට ඒ පුවත් දුන්නේ කවුදැයි විමසී ය. පුවත් ලැබුණ හැටි හෙළිකළ හැක්කේ උසාවියේ දී එසේ කරන ලෙස තමාට කීවොත් පමණක් යයි ඒ පුවත දිවයිනට ලියූ මාධ්‍යවේදියා පොලීසියට පිළිතුරු ලෙස කියා ඇත.

# ලංකා දේශපාලකයින් මත්කුඩු ජාවාරමට සම්බන්ධයි! අගමැති දි මු ජයරත්න පාර්ලිමේන්තුවේදී කියයි

ශ්‍රීලංකාව තුළ දැනට බහුලව කෙරෙන හෙරොයින් හා ගංජා ඇතුළු මත්ද්‍රව්‍ය ජාවාරමට සමහර දේශපාලකයින් ද සම්බන්ධ බව අගමැති දි මු ජයරත්න මහතා පසුගිය බදාදා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළේය ඒ මහතා එසේ කීවේ විපක්ෂයේ ජෝන් අමරතුංග මහතා ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි. සමහර දේශපාලකයින් මත්ද්‍රව්‍ය ලංකාවට ගෙන්වන්නට සෘජුවම සම්බන්ධව සිටින බව කී අමරතුංග මහතා ඒ ගෙන්වීමේදී ලංකා පොලීසිය හා මත්ද්‍රව්‍ය වැටලීම් ඒකකය එක්ව වරදකරුවන් අල්ලාගත් විට දේශපාලකයින් ඒ වරදකරුවන් මුදා හරින ලෙස පොලීසියට බලපෑම් කරන බව ද කීය.

2010 එනම් පසුගිය වසරේ මත්ද්‍රව්‍ය හා සම්බන්ධ වරදවල් වලට පුද්ගලයින් 29,000 දෙනෙකු නීතියේ රැහැණට අල්ලා ගෙන ඔවුන් වරදකරුවන් කොට සිරගෙට යවා තිබේ. 2009 වසරේද මත්ද්‍රව්‍ය වරදට පුද්ගලයින් 18,743 ක් හිරගෙට යවා ඇත. මේ අනුව එන්න එන්නම මත්ද්‍රව්‍ය අපරාධ වැඩිවන බව පෙනේ යයි ද අමරතුංග මහතා පැවසී ය. ලංකාවට හෙරොයින් ගෙන එන්නේ ගුවන්තොටුපළ වරාය සහ මුහුදු කරය හරහාය. මෙය දිනපතාම සිදුවෙමින් පවතී. ශ්‍රීලංකා රජය ද දැනට සිංගප්පූරුවේ කර ඇතිවාක් මෙන් මත්ද්‍රව්‍ය වලින් තොර රටක සෑදීමට කටයුතු කළ යුතුයයි ද අමරතුංග මහතා කීවේය. මේ 2011 වසරේ ජනවාරි වල සිට මේ ජූනි මස දක්වා ගංජා කිලෝ 6430 ක් සහ හෙරොයින් කිලෝ 14 ක් ඒ පුද්ගලයින් සමග ලංකා පොලීසිය විසින් අල්ලා ගනු ලැබ නීතිය ඉදිරියට ගෙනවුත් ඇත.




# ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK — BOC BANK OF CEYLON — HNB — SEYLAN BANK LIMITED — NSB — HSBC — PEOPLE'S BANK — සම්පත් බැංකුව SampathBank — NDB bank — Standard Chartered

Strong. Safe. Reliable. MCG Mike Cooke Group
දින 7ම විවෘතයි

www.efastcash.biz

020 8886 4488

Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT